# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 29 දරන
# කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මැයි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මැයි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 29 දරන කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1992 මැයි මස 27 වන දින]**

**එල්. ඩී.—ඕ.—54/90**

### කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව.**

"කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වී ඇති රීති අනුව එම සංගමයේ පරමාර්ථ ඉටුකර ගැනීම සහ එහි සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් කල්මුණේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1992 අංක 29 දරන කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය සංස්ථාගත කිරීම.**

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට හා ඉන් පසුව, (මෙහි මින් මතු "ව්‍යාපාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින්නා වූ ද මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇත්තා වූ ද තැනැත්තන් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන්නා වූ තැනැත්තන් "කල්මුණේ හිමායතුල් ඉස්ලාම් ව්‍යාපාරය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) සංස්ථාවක් බවට පත් කරනු ලැබේ. ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධ ව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබීම කළ හැකි වන්නේ ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

3. මෙම සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ සියලු පහසුකම් සහිත අරාබි විද්‍යාලයක් පිහිටුවීම සහ යහපත් චරිතයක් සහ 'ෂරියත්' ක්ෂේත්‍රයෙහි නිපුණ දැනුමක් සහ හැකියාව ද ඇති තරුණයන් පුහුණු කිරීම හා බිහි කිරීම අරභයා යථෝක්ත අරාබි විද්‍යාලයය සඳහා අංග සම්පූර්ණ පුස්තකාලයක් පිහිටුවීම ද වේ.

සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් සෙසු පරමාර්ථ පහත දැක්වෙන පරිදි වේ:—

(අ) මුස්ලිම් ජනතාව වෙතින් දිළිඳුකම තුරන් කිරීම;

(ආ) ශුද්ධ වූ කුරාණය, හදීත්ස්, ඉජ්මා හා කියාස්වලට අනුකූලව මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනික, සංස්කෘතික, අධ්‍යාත්මික හා සමාජයීය ශුභසාධනය සහ යහපත නංවාලීම ;

(ඇ) සුදුස්සන්ට රැකියා හා තාක්ෂණික පුහුණුව ලබාදීම ;

(ඈ) ෂිර්කත් හා කිරාල් න්‍යායට අනුකූලව මුදල් ආධාර ලබාදීම ;

(ඉ) සකාත්, සදකා සහ පරිත්‍යාග එකතු කොට බයිතුල් මාල් පිහිටුවීම ;

(ඊ) ඉස්ලාමීය ප්‍රතිපත්ති ගරු කරන හෝ ඒවා ක්‍රියාත්මක කරන හෝ ඉස්ලාමීය ප්‍රතිපත්තිවලට අනුකූල නොවන පරිචයන් තහනම් කරන හෝ ඉවත් කරන වෙනත් සමාජ සංවිධාන සහ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා ඒවාට උපකාර කිරීම ;

(උ) මුස්ලිම්වරුන්ගේ ප්‍රගතිය හා ශුභසාධනය සඳහා අනෙකුත් විවිධ සමාජ කටයුතු බාර ගැනීම හා ක්‍රියාත්මක කිරීම ;

(ඌ) ඉස්ලාම් ධර්මයේ හා මුස්ලිම්වරුන්ගේ අනන්‍යතාව ආරක්ෂා කිරීම ;

(එ) ඉස්ලාම් ධර්මය පෝෂණය කිරීම, පැතිරවීම හා ආරක්ෂා කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබාගැනීමේ ද දාන සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීති වලට යටත්ව සංස්ථාව වෙත පවරා ඇති, සතුකර දී ඇති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධර යන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉෂ්ට සාර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා, කාරණා සහ දේවල් සිදු කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධාරියන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන වෙනත් සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී ධුර දැරූ ව්‍යාපාරයේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

නිලධාරි මණ්ඩලය සහ පාලක සභාව තෝරා පත්කර ගැනීම.

**6.** පාලක සභාව සංස්ථාපිත කිරීම සඳහා නිලධාරි මණ්ඩලයට සභාපතිවරයකු, උප සභාපතිවරුන් පස් දෙනකු, ප්‍රධාන ලේකම්වරයකු, සහකාර ලේකම්වරුන් දෙදෙනකු, භාණ්ඩාගාරිකවරයකු සහ සහකාර භාණ්ඩාගාරිකවරයකු ඇතුළත් විය යුතු වන්නේය.

සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම පාලක සභාවේ නිලධාරීන් හා සෙසු සභිකයන් දොළොස් දෙනා ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතු වන්නේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන රැස්වීමකදී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයකින්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් සුදුසු යයි අදහස් කරන විට කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේය .—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම, සංස්ථාවේ නිලධරයන් සහ කළමනාකාර මණ්ඩලය සහ කලින් කල පිහිටුවනු ලබන වෙනත් යම් විශේෂ කමිටුවක් තෝරා පත්කර ගැනීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන්ගේ සහ කළමනාකාර මණ්ඩලයේ හා වෙනත් කමිටුවල සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) කළමනාකාර මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළ යුතු ආකාරය සහ විශේෂයෙන්ම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්ගේ කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකාර මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී ඔවුන් විසින් දරනු ලැබූ වියදම් සංස්ථාවේ අරමුදල්වලින් ගෙවීම ;

(ඊ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කරගෙන යාම සහ එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව අයවිය යුතු සහ සංස්ථාව විසින් ගෙවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ව්‍යාපාරයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ව්‍යාපාරයට ලැබිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු අන්දම.

**9.** සංස්ථාවේ රීති මගින් නියම කර ඇති සාමාජිකයන් පුද්ගල සංඛ්‍යාව ඉදිරිපිට මිස කවර හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් තමන් පැමිණ සිටීමේ සලකුණක් වශයෙන් තම තම එහි අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් වෙනත් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු වන්නේ ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** මෙම පනතේ විධිවිධානවලට යටත්ව මේ පනතේ පරමාර්ථ යන් සපුරා ගැනීම සඳහා කවර ආකාරයක හෝ මිලට ගැනීමකින් ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු පැවරීමකින් හෝ වෙනත් කවරාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබූ චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීත්‍යනුකූලව බලය ඇති අතර සංස්ථාවෙහි තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ උගස් කිරීමේ, විකිණීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් ඒ දේපළ දැරිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මෙම පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියනු වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපණය.

**12.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

1. ෂරියත් යන්නෙන් ඉස්ලාමීය නීතිය අදහස් වේ ;
2. හදිත්ස් යන්නෙන් අනාගත වක්තෘතුමාගේ දේශනා, ක්‍රියා හා එතුමාගේ අනුමැතිය අදහස් වේ ;
3. ඉජ්මා යන්නෙන් ඉස්ලාම් ධර්මය හදාළ ප්‍රාඥයන්ගේ ඒකමතික තීරණ අදහස් වේ ;
4. කියාස් යන්නෙන් කුරාණයේ හා හදිස්හි දැක්වෙන සමාන්තර ක්‍රියා හා දේශනා සැලකිල්ලට ගෙන එළඹෙන තීරණ අදහස් වේ ;
5. ෂිර්කත් යන්නෙන් සමූහ ව්‍යාපාරය අදහස් වේ ;
6. කිරාල් යන්නෙන් මූල ධනය අවශ්‍ය කුසලතා ඇති තැනැත්තන්ට මූල්‍ය ආධාර දීම සහ එසේ ආරම්භ කරන ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ බෙදාගැනීම අදහස් වේ ;
7. බයිතුල් මාල් යන්නෙන් රාජ්‍යයේ ආදායම තැන්පත් කොට පාලනය කරන මුස්ලිම් රාජ්‍යයේ භාණ්ඩාගාරය අදහස් වේ ;

8. සදකා යන්නෙන් පිං තකා දෙනු ලබන ඕනෑම දෙයක් අදහස් වේ;

9. සකාත් යන්නෙන් ඉස්ලාම් නීතිය ප්‍රකාර යම් තැනැත්තකු ගේ වස්තුව, දේපළ හා සමහර භාණ්ඩ සඳහා නියම කර ඇති බදු ක්‍රමයක් අදහස් වේ.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

## උපලේඛනය

[2 වන වගන්තිය]

**සංස්ථාවේ ආරම්භක සාමාජිකයෝ**

1. මවුලවි ෆාසිල් එස්. එම්. එම්. සාහිබ්, ගපූරි (ලංකා); නද්වි (ලක්නව්)
2. අල් හාජ් එම්. අයි. එම්. කාසිම්
3. අල් හාජ් මවුලවි කේ. එල්. එම්. ෆාරූක්, ගපූරි (ලංකා)
4. මවුලවි එම්. එල්. එම්. සුල්තාන් ඉබ්‍රාහිම්
5. මවුලවි මුස්තාෆා මවුලානා
6. මවුලවි ඒ. එල්. ඉබ්‍රාලෙබ්බෙ, දේව්බන්ත් (දේව්බන්ත් ඉන්දියා)
7. මවුලවි හාෆිස් ඒ. එල්. ඉබ්‍රාලෙබ්බෙ, දේව්බන්ත් (දේව්බන්ත්, ඉන්දියා)
8. මවුලවි එස්. යූසුෆ්, ගපූරි (ලංකා)
9. ජනාබ් යූ. එස්. හමීඩ්
10. ජනාබ් එස්. එම්. යූසුෆ්
11. ජනාබ් එම්. එම්. ජලාල්දීන්
12. ජනාබ් ඒ. එල්. ඒ. කරීම්
13. ජනාබ් එම්. අයි. ලතීෆ්
14. ජනාබ් එම්. අයි. අබ්දුල් රාවූෆ්
15. ජනාබ් කේ. එම්. අබ්දුල් කාදර්
16. අල් හාජ් එස්. උදුමාලෙබ්බෙ
17. ජනාබ් එම්. අයි. එම්. හුසේන්
18. වෛද්‍යාචාර්ය ඒ. එල්. එම්. ජමීල්, එම්. බී. බී. එස් (ලංකා); එම්. ආර්. සී. ඕ. ජී. (යූ. කේ.)

19. ජනාබ් එම්. ඒ. එම්. හුසේන්, නීතිඥ විශ්‍රාමික දිස්ත්‍රික් විනිශ්චයකාර

20. ජනාබ් එම්. එච්. එම්. අෂ්රෆ්ප්, නීතිඥ

21. ජනාබ් එස්. එම්. මොහයිදීන්

22. අල් හාජ් යූ. සීනි මොහොමඩ්

23. මවුලවි ඒ. එස්. එම්. මුබාරක්

24. අල් හාජ් එම්. බී. එම්. සම්සුදීන්

25. ජනාබ් අල් හාජ් එම්. බී. එම්. ෂෙරීෆ්ප්

26. අල් හාජ් යූ. අහමඩ්ලෙබ්බේ

27. අල් හාජ් එම්. අයි. සෙයිනුල්ආබ්දීන්

28. ජනාබ් එච්. එම්. ඉස්සදීන්

29. ජනාබ් ඒ. එල්. ඒ. ලතීෆ්ප්

30. ජනාබ් එම්. ඒ. අබ්දුල් රහීම්

31. ජනාබ් ඒ. එම්. එස්. ලෙබ්බෙයි

32. ජනාබ් එම්. අයි. සිකන්දර්

33. ජනාබ් ඒ. එම්. හනීෆා

34. ජනාබ් එම්. එල්. ආදම්බාවා

35. ජනාබ් යූ. එල්. එම්. තමීම්

36. ජනාබ් එම්. එස්. එම්. මොහයිදීන්

37. ජනාබ් එච්. මීරාසාහිබ්

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.